www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකා ආන්ඩුව හිටපු ජනාධිපති අපේක්ෂකයාට එරෙහිව චෝදනා ඉදිරිපත් කිරීමට හදිසි නීතිය යොදාගනී

**Sri Lankan government uses emergency laws to charge former presidential**

**සරත් කුමාර විසිනි**

**2010 ජුලි 16**

ශ්‍රී ලංකාවේ ජනාධිපති මහින්ද රාජපක්ෂගේ ආන්ඩුව, පරාජිත ජනාධිපති අපේක්ෂක හිටපු හමුදාපති ජෙනරාල් සරත් ෆොන්සේකාට එරෙහිව බරපතල අපරාධ චෝදනා ඉදිරිපත් කරනු පිනිස සිය රුදුරු හදිසි නීති රෙගුලාසි යොදාගෙන තිබේ.

මාස පහකට වැඩි කාලයක් ඔහු මිලිටරි අත් අඩංගුවේ තබාගැනීමෙන් පසුව, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ද වන ෆොන්සේකාට එරෙහිව චෝදනා ඉදිරිපත් කිරීම, ඔහුව නිහඬ කිරීමේ වෑයමක් පමනක් නොවේ. එය වනාහි, ආන්ඩුව වැඩ කරන ජනතාව හා දුගී ජනයා මත දරුනු කප්පාදු පිලිවෙත් කඩාපාත් කිරීමට සූදානම් වන තතු යටතේ, රාජපක්ෂ ගන්නා වඩවඩා ආඥාදායක පියවර පිලිබඳ තවත් දර්ශකයකි.

ෆොන්සේකා කල බව කියන "බරපතල" වැරදි සම්බන්ධයෙන් "විශේෂ" නඩු විභාගයක් සඳහා සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත විනිසුරු මඬුල්ලක් පත් කරන ලෙස නීතිපති මොහාන් පීරිස් කොලඹ මහාධිකරනයෙන් නිල වසයෙන් ඉල්ලා ඇත. එවන් නඩු විභාග පැවැත්වෙන්නේ ජූරි සභාවකින් තොරව වන අතර වැරදිකරුවන් වන අයට ශ්‍රේෂ්ඨාධිකරනයට අභියාචනා කල හැක්කේ එක් වරක් පමනි.

ෆොන්සේකාට එරෙහිව හදිසි නීතිය රෙගුලාසි යටතේ චෝදනා දෙකක් ඉදිරිපත් කර තිබේ. එකක්, "මහජනයා බියවැද්දිය හැකි හෝ මහජනයා කැලඹිය හැකි ව්‍යාජ ප්‍රකාශයක් . . . පැතිරවීම" වන අතර අනික "කෙලින් ම හෝ අන්‍ය ආකාරයකින් ජාතිවාදී හැඟීම් ඇවිස්සෙනසුලු . . . තොරතුරු සැපයීම" යි. මෙම එක් එක් චෝදනාවට වසර පහක් දක්වා වන සිර දඬුවමක් පැමිනවිය හැකිය.

සිරගතව සිටින මන්ත්‍රීවරයාට දන්ඩ නීති සංග්‍රහය යටතේ "කෙලින් ම හෝ අන්‍ය ආකාරයකින් ජාතිවාදී හැඟීම් ඇවිස්සෙනසුලු යම් කරුනක් සම්බන්ධයෙන් තොරතුරු සැපයීමෙන් . . . කතාකරනු ලැබූ හෝ කියවීමට අදහස් කරනු ලැබූ වචනයෙන්, පිහිටවනු ලැබූ ලංකා ආන්ඩුවට විරුද්ධත්වයක් දැක්වීමේ හැඟීම් ඇවිස්සීමෙන් හෝ ඇවිස්සීමට තැත් කිරීමෙන් හෝ . . . වැසියන් අතර අසන්තෝෂය හෝ විරුද්ධත්වය ඇති කරවීමට හෝ එබඳු වැසියන්ගේ හෝ වෙනත් පන්ති අතර හතුරු වූ ද අසමගි වූ ද හැඟීම් වැඩි දියුනු කිරීමට තැත් කිරීම" ගැන ද චෝදනා නගා තිබේ. මෙම චෝදනාවට වසර දෙකක බරපතල වැඩ සහිත සිර දඬුවමක් පැමිනවිය හැකිය.

ජනාධිපතිවරනයෙන් යන්තම් සති දෙකකට පසුව, පෙබරවාරි 8 දා මිලිටරිය විසින් ෆොන්සේකා හිතුමතේට අත් අඩංගුවට ගන්නා ලදී. ජනාධිපතිවරනයේ දී පාර්ලිමේන්තුවේ ප්‍රධාන විරුද්ධ පක්ෂ සහ ව්‍යාපාරික සංස්ථාපිතයේ කොටස් රාජපක්ෂට එරෙහි අපේක්ෂකයකු ලෙස ඔහුට සහයෝගය දුන්හ. රාජපක්ෂ ඝාතනය කිරීමට කුමන්ත්‍රනය කල බවට ඔහුට මුලින් චෝදනා එල්ල වූ අතර, හමුදා සේවයේ සිටිය දී දේශපාලන ක්‍රියාකාරකම්වල නිරතවීම සහ අවි මිලදී ගැනීමේ දී හමුදාවේ ක්‍රියාපරිපාටි උල්ලංඝනය කිරීම පිලිබඳ චෝදනා යටතේ හමුදා අධිකරන මන්ඩල දෙකක් ඉදිරියේ ඔහුට එරෙහි නඩු විභාග තවමත් පැවැත්වේ.

අලුත් අපරාධ චෝදනා මේ අවස්ථාවේ ඉදිරිපත් කිරීම අවධාරනය කෙරෙන්නේ, ආන්ඩුව සිය පොලිස්-මිලිටරි විධික්‍රම උත්සන්න කිරීමට ද සියලු දේශපාලන විරුද්ධවාදීන්ට හා කම්කරු පන්තියට එරෙහිව මර්දනකාරී පියවර වඩවඩා යොදාගැනීමට ද ක්‍රියා කරන බවයි.

මෙම චෝදනා පැනනැගෙන්නේ, මීට මාස හතකට ඉහත දී කොලඹ-පාදක *සන්ඩේ ලීඩර්* පත්‍රයේ කතුවරිය වන ෆෙඩ්රිකා ජැන්ස්ට ෆොන්සේකා ලබා දුන් සම්මුඛ සාකච්ඡාවකිනි. දෙසැම්බර් 13 දා පල වූ එම සම්මුඛ සාකච්ඡාවේ දී, ෆොන්සේකා, පසුගිය වසරේ මැයි මස දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයේ මිලිටරි පරාජයේ අවසන් දින කිහිපය තුල දී යටත් වීමට උත්සාහ කල එල්ටීටීඊ නායකයන් මරා දමන ලෙස අන දුන්නේ යැයි ජනාධිපතිගේ සොහොයුරු ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂට චෝදනා කලේය.

ෆොන්සේකා මෙසේ පැවසුවේ යැයි එය උපුටා දක්වයි: "යටත් වීමට උත්සාහ දරන සියලු එල්ටීටීඊ නායකයන්ට එසේ යටත් වීමට ඉඩ නොදිය යුතු බවත් ඔහු සියල්ලන්ම මරා දැමිය යුතු බවත්, 58 වන සේනාංකයේ අන දෙන නිලධාරි බ්‍රිගේඩියර් ෂවේන්ද්‍ර සිල්වාට ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතා කියා තිබුනා." තමන්ට මෙම තොරතුරු ලැබුනේ හමුදා සේනාංකයට අනුයුක්ත කර තිබූ මාධ්‍යවේදියකුගෙන් යයි ෆොන්සේකා පැවසීය. කෙසේවෙතත්, එම වාර්තාව පල වීමෙන් පසුව, ෆොන්සේකා කියා සිටියේ පුවත්පත විසින් තමාව වැරදියට උපුටා දක්වා ඇති බවයි.

එල්ටීටීඊ නායකයන් තිදෙනෙකු -- දේශපාලන අංශයේ නායක බාලසිංහම් නඩේෂන්, සාම ලේකම් කාර්යාලයේ ප්‍රධානි සීවරත්නම් පුලිදේවන් සහ මිලිටරි නායකයකු වන රමේෂ්" නෝර්වේ ඇතුලු විවිධ අතරමැදියන් හරහා ඉහල පෙලේ රජයේ නිලධාරින් සමග යටත් වීමේ සාකච්ඡාවල නිරත වූ බව ප්‍රසිද්ධ කරුනකි. සුදු කොඩි රැගෙන ආන්ඩුවේ හමුදා ඉදිරියට පැමිනෙන ලෙස එල්ටීටීඊ නායකයන්ට උපදෙස් ලැබී තිබුනි. මැයි 18 දා පාන්දර එසේ යටත් වීමට පැමිනෙමින් සිටිය දී ඔවුන් තිදෙනා අමු අමුවේ ඝාතනය කරන ලදි.

මෙම යුද අපරාධය යුද්ධයේ අවසන් මාස ගනනාව තුල සිදු කෙරුනු බොහෝ අපරාධවලින් එකකි. මිලිටරියේ බෝම්බ හා ෂෙල් ප්‍රහාර මගින් දෙමල සිවිල් වැසියන් දහස් ගනනක් ඝාතනය කෙරුනි. එසේ මිය ගිය සිවිල් වැසියන් සංඛ්‍යාව 7,000ක් යයි එක්සත් ජාතීන්ගේ සංවිධානය තක්සේරු කර තිබේ. බ්‍රස්ල්ස්-පාදක ජාත්‍යන්තර අර්බුද කන්ඩායම, මිය ගිය සිවිල් වැසියන් සංඛ්‍යාව 30,000 හා 75,000 අතර වන බවට සාක්ෂ්‍ය සම්පාදනය කර ඇත.

*සන්ඩේ ලීඩර්* සම්මුඛ සාකච්ඡාව රටේ ජාත්‍යන්තර ප්‍රතිරූපයට හානි කල බවත් යුද අපරාධ පිලිබඳ පරීක්ෂන ඉල්ලා සිටීමට මානව හිමිකම් කන්ඩායම් හා දෙමල ඩයස්පෝරාව එය යොදාගෙන ඇති බවත්, ෆොන්සේකාට එරෙහි චෝදනා පත්‍රයේ පිටු හතරකින් යුක්ත පූර්විකාව තුල, නීතිපති චෝදනා කර සිටී. සම්මුඛ සාකච්ඡාව මිලිටරියේ "හොඳ නමට" හානි කරමින්, එක්සත් ජනපදය වැනි රටවල් පුහුනු වැඩසටහන්වලට මෙරට සන්නද්ධ හමුදාවේ සාමාජිකයන්ට ආරාධනා කිරීම නතර කිරීමට පවා හේතු වී ඇතැයි ද පීරිස් තව දුරටත් කියාසිටී.

මෙම චෝදනා මූලික ප්‍රජාතන්ත්‍ර අයිතීන්ට එරෙහි පරිපූර්න ප්‍රහාරයකි. පීරිස්ගේ සිය චෝදනාවලට යොදා ගන්නේ, යුද අපරාධ ගැන කතා කරන හෝ ඒ ගැන ලියන නැතහොත් ඒ පිලිබඳව ස්වාධීන පරීක්ෂනයක් ඉල්ලා සිටින ඕනෑම අයෙකුට එරෙහිව ආන්ඩුව යොදා ගන්නා භාෂාවට සමාන භාෂාවකි. එවන් ඕනෑම ඉල්ලීමක් මහජනයා බියවැද්දිය හැකි හෝ මහජනයා කැලඹිය හැකි ව්‍යාජ ප්‍රකාශයක්" හෝ "වැසියන් අතර අසන්තෝෂය ඇති කිරීම" ලෙස හංවඩු ගැසිය හැකිය.

එම චෝදනා මාධ්‍යවලට එරෙහි ඍජු තර්ජනයක් ද වේ. එල්ටීටීඊ නායකයන් තිදෙනා ඝාතනය කිරීම මුලින්ම එලිදරව් කෙරුනේ යුද්ධය අවසන් වීමෙන් දින කිහිපයකට පසුවය. බ්‍රිතාන්‍යයේ පාදක *සන්ඩේ ටයිම්ස්* සහ *ගාර්ඩියන්* පුවත්පත් එම සිද්ධිය පිලිබඳව වාර්තා පල කලේය. එම අවස්ථාවේ දී, ෆොන්සේකා, හමුදාපති ලෙස, එම චෝදනා පසෙකට දැමීමෙහි ලා ආන්ඩුව සමග එක්විය.

මේ සතියේ දී, තවත් අපරාධ චෝදනා දෙකක් හදිසියේ ම ෆොන්සේකාට එරෙහිව ඉදිරිපත් කෙරුනි. අඟහරුවාදා, යුද උපකරන මිලදී ගැනීමේ ටෙන්ඩර් ක්‍රියාදාම තුල දී මහජන මුදල් වංචා කිරීම පිලිබඳ චෝදනා 21ක් මත, පොලීසිය ඔහුට හා ඔහුගේ බෑනා වන දනුන තිලකරත්නට අධිචෝදනා ඉදිරිපත් කලේය. එදිනම, ඔහුගේ ජනාධිපතිවරන ව්‍යාපාරය සඳහා හමුදාව හැරගියවුන් 10ක් සේවයේ යොදාගත් බවට චෝදනා කරමින් නීතිපති ෆොන්සේකාට එරෙහිව අධිචෝදනා ඉදිරිපත් කලේය.

හමුදාපති ලෙස, ෆොන්සේකා, 2006 දී යුද්ධය යලි අවුලුවාලූ රාජපක්ෂ ආන්ඩුව සමග ඉතා සමීපව වැඩ කරමින්, රුදුරු ලෙස යුද්ධය ගෙන ගියේය. මැයි මස මිලිටරිය එල්ටීටීඊය පරාජය කරන තෙක්ම, ෆොන්සේකා රාජපක්ෂගේ පාලක කට්ටුවේ ප්‍රධාන සාමාජිකයෙක් විය. පාලක සංස්ථාපිතය තුල සිටින මෙම විවේචකයාට එරෙහිව මෙතරම් ක්ෂමාවිරහිත ලෙස ක්‍රියා කිරීම මගින් ආන්ඩුව වැඩ කරන ජනතාවට එරෙහිව තර්ජනකාරී පනිවිඩයක් නිකුත් කරයි.

මෙම චෝදනා ඉදිරිපත් කිරීමට පෙර, රාජපක්ෂ, කලින් අධිකරන අමාත්‍යංශයේ කොටසක්ව පැවති නීතිපති දෙපාර්තමේන්තුව සිය ඍජු පාලනය යටතට ගෙන ආවේය. සාම්ප්‍රදායිකව යම් ආකාරයක නෛතික ස්වාධීනත්වයක් පවත්වා ගෙන ගිය නීතිපති

කාර්යාලය දැන් දේශපාලන විරුද්ධවාදීන්ට එරෙහිව බොරු නඩු ඇටවීමට හා ඔවුන් සිරගත කිරීමට යොදා ගැනෙයි. මෙය වනාහි, ආරක්ෂක ඇමති මෙන් ම මුදල් ඇමති ද වන, සිය අනසක යටතට අමාත්‍යංශ හා රජයේ සෙසු ආයතන 60ක් ගෙනවිත් තිබෙන, රාජපක්ෂගේ දෑතෙහි වඩා පුලුල් බලතල ගොනු කර ගැනීමක කොටසකි.

මෙම වර්ධනයන් සිදු වන්නේ, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ නියෝග පරිදි, ආන්ඩුවේ දැවැන්ත නය කන්දරාවේ හා අයවැය හිඟයේ බර වැඩ කරන ජනතාවගේ කර මත කඩාපාත් කිරීම පිනිස සැලසුම් කෙරුනු කප්පාදු පිලිවෙත් ක්‍රියාවට දැමීම ආන්ඩුව ආරම්භ කර ඇති තතු තුලය.

පසුගිය මාසයේ ඉදිරිපත් කල අයවැය, රාජ්‍ය අංශයේ සේවකයන් මත පුලුල් වැටුප් කැටි කිරීමක් ද අත්‍යවශ්‍ය ද්‍රව්‍ය මත බදු වැඩි කිරීමක් ද එලිමහනට ගෙන ආ අතර රජය සතු සංස්ථා ප්‍රතිව්‍යුහගත කිරීම අරඹමින් තිබේ. එය රැකියා හා සේවා කොන්දේසි මත බරපතල ලෙස බලපානු ඇත. එමෙන්ම ආන්ඩුව මහ ව්‍යාපාරිකයන්ට හා ආයෝජකයන්ට බදු සහන ලබා දෙයි. නොවැම්බරයේ දී ඉදිරිපත් කිරීමට නියමිත 2011 වසරේ අයවැය යෝජනා තුල අයවැය හිඟය තියුනු ලෙස කප්පාදු කිරීමට තවත් පිලිවෙත් සැලසුම් කරන බවට ආන්ඩුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට පොරොන්දු වී තිබේ.

යුද්ධයේ අවසානයේ සිට මේ දක්වා, ආන්ඩුව කම්කරුවන්ගේ අරගල මැඩීම පිනිස හදිසි නීති බලතල පවත්වා ගෙන විත් තිබේ. පසුගිය වසරේ දී, රාජපක්ෂ විදුලි බල, වරාය, ඛනිජ තෙල් හා ජල සම්පාදන මන්ඩලය කම්කරුවන්ට එරෙහිව අත්‍යවශ්‍ය සේවා නියෝග නිකුත් කලේය. කෙසේවෙතත්, වෘත්තීය සමිති වැටුප් උද්ඝෝෂනය නතර කල බැවින් හදිසි නීති බලතල යොදාගැනුනේ නැත.

මේ මස මුල දී, කොලඹ මට්ටක්කුලියේ පැල්පත් වාසීන් දහස් ගනනකට එරෙහිව මිලිටරි-පොලිස් ත්‍රස්ත ව්‍යාපාරයක් දියත් කෙරුනි. එහි සමස්ත වැඩිහිටි ජනගහනයම කොටු කරන 200කට වැඩි පිරිසක් අත් අඩංගුවට ගැනුනු අතර එයින් 30ක් පමන තවමත් අත් අඩංගුවේ පසුවේ. ෆොන්සේකාට එරෙහි චෝදනා ආඥාදායක පාලක විධික්‍රමවලට හැරීම පිලිබඳ තවත් අනතුරු ඇඟවීමකි.

© www.wsws.org